# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ


අංක 2202/24 - 2020 නොවැම්බර් මස 20 වැනි සිකුරාදා - 2020.11.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 57 (1) වන ව්‍යවස්ථාව ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලතල පැවරීම

1. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 57 (I) වන ව්‍යවස්ථාවේ 1 වන ඡේදයේ නියමයන්ට අනුකූලව පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ශ්‍රී ලංකා පොලිස් සේවයේ නිලධාරීන්ගේ සහ පොලිස් දෙපාර්තමේන්තුව යටතේ සිටින නිලධාරීන් සම්බන්ධව වන පහත වගුවේ III තීරුවේ සඳහන් බලතල එම වගුවේ II තීරුවේ නිශ්චිතව නියම කර ඇති රජයේ නිලධාරීන් වෙත රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවරා දෙනු ලැබේ.

2. අංක 2161/32 හා 2020.02.06 දිනැති *අතිවිශෙෂ ගැසට්* නිවේදනය මගින් ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් සිදුකර ඇති බලතල පැවරීම යටතේ ගන්නා ලද හෝ ගනු ලබනු ඇතැයි සලකන යම් ක්‍රියා මාර්ගයකට අගතියක් නොවන පරිදි එම *ගැසට්* නිවේදනය ප්‍රත්‍යාදිෂ්ඨ වන බවටත්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් මෙයින් නිශ්චිතව නියම කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අණ පරිදි,

**එම්. ජ්. බී. දයා සෙනරත්,**
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2020 නොවැම්බර් මස 19 වැනි දින,
අංක 1200/9, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී ය.


1A - G 33220 — 31 (2020/11)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

| *I තීරුව*<br>*නිලධාරී වර්ග* | *II තීරුව*<br>*බලතල පවරනු ලබන රාජ්‍ය නිලධරයන්* | *III තීරුව*<br>*පවරන ලද බලතල* |
|---|---|---|
| 01. සහකාර පොලිස් අධිකාරි සහ ඊට ඉහළ නිලයන්. | පොලිස් විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් | (I) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ පටිපාටිවලට අනුකූලව ස්ථාන මාරු කිරීම.<br>(II) ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදයේ දෙවැනි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති වැරදි පිළිබඳ විනය පාලනය.<br>(III) විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 17 වන වගන්තිය යටතේ වන විශ්‍රාම ගැන්වීම සම්බන්ධයෙන් කටයුතු කිරීම |
| 02. ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී, පොලිස් අධිකාරී, සහකාර පොලිස් අධිකාරි නිලයන් සහ පොලිස් ස්ථානභාර නිලධාරීන් | පොලිස් විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් | (I) පොලිස්පතිවරයාගේ නිර්දේශ අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යපටිපාටික රීති 218 සිට 223 දක්වා ඇති විධිවිධාන අනුව ස්ථාන මාරු කිරීම |
| 03. පොලිස් ස්ථානභාර නිලධාරීන් | පොලිස්පති | (I) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ පටිපාටිවලට අනුකූලව පත්කිරීම සහ ස්ථානමාරු කිරීම. |
| 04. ප්‍රධාන පොලිස් පරීක්ෂක සහ ඊට පහළ නිලයන් (පොලිස් ස්ථාන භාර නිලධාරීන් ඇතුළුව) පොලිස් ආරක්ෂක සහායක නිලධරයන් ඒකාබද්ධ සේවාවන්ට අයත් නොවන, අංක 03/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ (උපලේඛන III) හි අර්ථ නිරූපණය කර ඇති ප්‍රාථමික මට්ටමේ සහ ද්විතීයික මට්ටමේ නිලධරයන් | පොලිස්පති | (I) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ බඳවා ගැනීමේ පටිපාටි / සේවා ව්‍යවස්ථාවලට අනුකූලව පත් කිරීම සහ උසස් කිරීම (විශේෂ උසස් කිරීම් හැර).<br>(II) පරිවාස කාලය තුළ දී පත්වීම අවලංගු කිරීම හෝ අවසන් කිරීම.<br>(III) පරිවාස කාලපරිච්ඡේදයෙන් හෝ වැඩ බැලීමේ කාලපරිච්ඡේදයෙන් පසු සේවයේ ස්ථිර කිරීම හෝ පරිවාස කාලය හෝ වැඩබැලීමේ කාලය දීර්ඝ කිරීම.<br>(IV) සේවයෙන් ඉල්ලා අස්වීමේ ලිපි පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම.<br>(V) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ පටිපාටිවලට අනුකූලව ස්ථාන මාරු කිරීම<br>(VI) රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යපටිපාටික රීති 218 සිට 223 දක්වා ඇති විධිවිධාන අනුව ස්ථාන මාරු කිරීම. (පොලිස් ස්ථාන භාර නිලධාරීන් හැර)<br>(VII) වැඩ තහනම් කිරීම, සේවයෙන් පහ කිරීම ඇතුළුව විනය පාලනය.<br>(VIII) ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති හෝ ඊට පහළ නිලයක් දරන නිලධාරියකු විසින් පනවා ඇති විනය දඬුවම්වලට එරෙහිව ඉදිරිපත් කරනු ලබන අභියාචනා සලකා බැලීම සහ ඒ අනුව පනවා ඇති විනය නියෝගයක් ස්ථිර කිරීම, ප්‍රතිශෝධනය කිරීම, වෙනස් කිරීම හෝ අහෝසි කිරීම |

| *I තීරුව*<br>*නිලධාරී වර්ග* | *II තීරුව*<br>*බලතල පවරනු ලබන රාජ්‍ය නිලධරයන්* | *III තීරුව*<br>*පවරන ලද බලතල* |
|---|---|---|
| 05. ප්‍රධාන පොලිස් පරීක්ෂක සහ ඊට පහළ නිලයන්. (පොලිස් ස්ථාන භාර නිලධරයන් හැර)<br>පොලිස් ආරක්ෂක සහායක නිලධාරීන්.<br>ඒකාබද්ධ සේවාවන්ට අයත් නොවන, අංක 03/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ (උපලේඛන III) හි අර්ථ නිරූපණය කර ඇති ප්‍රාථමික මට්ටමේ සහ ද්විතීයික මට්ටමේ නිලධරයන්. | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති (පරිපාලන) | (I) පරිවාස කාලපරිච්ඡේදයෙන් හෝ වැඩ බැලීමේ කාලපරිච්ඡේදයෙන් පසු සේවයේ ස්ථිර කිරීම.<br>(II) වැඩබැලීමේ කාලය දීර්ඝ කිරීම සහ කාර්යක්ෂමතා කඩඉම් අවශ්‍යතා සම්පූර්ණ කිරීම පිණිස පරිවාස කාලය උපරිම වසර තුනක් දක්වා කාලයකට දීර්ඝ කිරීම.<br>(III) සේවයෙන් ඉල්ලා අස්වීමේ ලිපි පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම. |
| 06. ඒකාබද්ධ සේවාවන්ට අයත් නොවන, අංක 03/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ (උපලේඛන III) හි අර්ථ නිරූපණය කර ඇති ප්‍රාථමික මට්ටමේ සහ ද්විතීයික මට්ටමේ නිලධරයන් | අධ්‍යක්ෂ / සිවිල් පරිපාලන | (I) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ පටිපාටිවලට අනුකූලව හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යපටිපාටික රීතී 218 සිට 223 දක්වා ඇති විධිවිධාන අනුව ස්ථාන මාරු කිරීම.<br>(II) වැඩබැලීමේ කාලය දීර්ඝ කිරීම සහ කාර්යක්ෂමතා කඩඉම් අවශ්‍යතා සම්පූර්ණ කිරීම පිණිස පරිවාස කාලය උපරිම වසර තුනක් දක්වා කාලයකට දීර්ඝ කිරීම. |
| 07. ප්‍රධාන පොලිස් පරීක්ෂක සහ ඊට පහළ නිලයන්. (පොලිස් ස්ථාන භාර නිලධරයන් හැර)<br>පොලිස් ආරක්ෂක සහායක. | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති | (I) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ පටිපාටි-වලට අනුකූලව හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යපටිපාටික රීතී 218 සිට 223 දක්වා ඇති විධිවිධාන අනුව තම පරිපාලන බලප්‍රදේශය තුළ ස්ථාන මාරු කිරීම.<br>(II) පහත සඳහන් කරුණු එනම්:<br>(i) සේවයෙන් පහ කිරීම.<br>(ii) පරිවාස කාලය තුළ පත්වීම අවලංගු කිරීම හෝ සේවය අවසන් කිරීම; සහ<br>(iii) සේවය හැරයාමේ නියෝගයන්ට එරෙහි වන අභියාචනා සළකා බැලීම;<br>හැර වැඩ තහනම් කිරීම් ඇතුළුව ඔවුන්ගේ පරිපාලන බල ප්‍රදේශ තුළ විනය පාලනය |
| 08. ප්‍රධාන පොලිස් පරීක්ෂක සහ ඊට පහළ නිලයන් (පොලිස් ස්ථාන භාර නිලධාරීන් හැර)<br>පොලිස් ආරක්ෂක සහායක. | නියෝජ්‍ය පොලිස්පති | (I) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ පටිපාටිවලට අනුකූලව හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යපටිපාටික රීතී 218 සිට 223 දක්වා ඇති විධිවිධාන අනුව තම පරිපාලන බලප්‍රදේශය තුළ ස්ථාන මාරු කිරීම. |

| *I තීරුව*<br>*නිලධාරී වර්ග* | *II තීරුව*<br>*බලතල පවරනු ලබන රාජ්‍ය නිලධරයන්* | *III තීරුව*<br>*පවරන ලද බලතල* |
|---|---|---|
| 09.මහසැරයන් සහ ඊට පහළ නිලයන් පොලිස් ආරක්ෂක සහායක. | නියෝජ්‍ය පොලිස්පති | (I) පහත සඳහන් කරුණු එනම්;<br>(i) සේවයෙන් පහ කිරීම.<br>(ii) පරිවාස කාලය තුළ පත්වීම අවලංගු කිරීම හෝ සේවය අවසන් කිරීම; සහ<br>(iii) සේවය හැරයාමේ නියෝගයන්ට එරෙහි වන අභියාචනා සළකා බැලීම;<br>හැර ඔවුන්ගේ පරිපාලන බල ප්‍රදේශ තුළ විනය පාලනය |
| 10.පොලිස් පරීක්ෂක සහ ඊට පහළ නිලධරයන්. (පොලිස් ස්ථාන භාර නිලධාරීන් හැර) පොලිස් ආරක්ෂක සහායක | 1. ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී<br>2. පොලිස් අධිකාරී<br>(ප්‍රාදේශීය කොට්ඨාස භාර නිලධාරී හෝ ක්‍රියාකාරී කොට්ඨාස භාර අධ්‍යක්ෂවරයකු වන) | (I) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ පටිපාටිවලට අනුකූලව හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යපටිපාටික රීතී 218 සිට 223 දක්වා ඇති විධිවිධාන අනුව තම පරිපාලන බලප්‍රදේශය තුළ ස්ථාන මාරු කිරීම. |
| 11.පොලිස් පරීක්ෂක සහ ඊට පහළ නිලයන්. (පොලිස් ස්ථාන භාර නිලධාරීන් හැර) පොලිස් ආරක්ෂක සහායක | 1. නියෝජ්‍ය පොලිස්පති<br>2. ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී<br>3. පොලිස් අධිකාරී | (I) අදාළ පරිපාලන බලප්‍රදේශය තුළ වැඩ තහනම් කිරීම.<br>(II) අදාළ පරිපාලන බලප්‍රදේශය තුළ විනය ශාලා දඬුවම්. |
| | සහකාර පොලිස් අධිකාරී | (I) අදාළ පරිපාලන බලප්‍රදේශය තුළ වැඩ තහනම් කිරීම. (පොලිස් පරීක්ෂක හැර)<br>(II) අදාළ පරිපාලන බලප්‍රදේශය තුළ විනය ශාලා දඬුවම් |

11 - 419

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.